සෞභාග්‍යමත් දේශයක් උදෙසා සුසංවේද -2021

# මානව සංවර්ධනය උදෙසා පාසල් අධ්‍යාපනය

## සිව්වන බුද්ධි කලම්භන සැසිය






මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

# මානව සංවර්ධනය උදෙසා පාසල් අධ්‍යාපනය

### අධ්‍යාපනය සම්බන්ධයෙන් පවතින නිර්වචන

අධ්‍යාපනය යන සංකල්පය බිහි වී ඇත්තේ ලතින් භාෂාවේ ( Educo / E-ducere) යන වචනයෙනි. සෑම පුද්ගලයෙක් සතුවම තමාට ආවේණික වූ විභව ශක්තියක් පවතින අතර, එම විභව ශක්තිය පිටතට ගැනීම/ සැඟ වී ඇති හැකියාවන් ඇද ගැනීම Educo යන්නෙන් අදහස් වේ. එය වියුක්ත සංකල්පයක් වන අතර, එයට පැහැදිලි නිර්වනයක් සැපයීම අසීරුය. එය පුද්ගලයා තුළ පවතින දැනුම, කුසලතාවය හා ආකල්ප වර්ධනය කිරීමේ ක්‍රියාවලියක් වන අතර, ඉගෙනීම, ඉගැන්වීම, රසවිඳීම, ඇගයීම හා පුහුණුව ආදි ක්ෂේත්‍ර සමුදායකින් එය සමන්විත වේ.

අධ්‍යාපනය සම්බන්ධයෙන් පැහැදිලි නිර්වනයක් ලබා දීම අසීරු වුවත් කාලානුරූපව විවිධ අර්ථකථන හා නිර්වචනයන් ඉදිරිපත් වී ඇත. ආචාර්ය පියරේ ගර්ටර් අධ්‍යාපනය හඳුන්වා දී ඇත්තේ "මානව ශික්ෂාව" වශයෙනි. ඒ අනුව පුද්ගලයකුගේ සියලු විභවතාවයන් ඉදිරියට ගෙන සංවර්ධනය කිරීමේ සංස්කෘතික ක්‍රියාවලිය අධ්‍යාපනය ලෙස හැඳින්වේ. "උසස්ම දෙය දැනුම බවත්, දැනුම ඇත්තා උසස්ම පුද්ගලයා බවත්, එය ලබන්නේ අධ්‍යාපනයෙන් බවත් " සොක්‍රටීස් දක්වා ඇත. ජෝන් ඩූ වී ට අනුව "ජීවත්වීමේ ක්‍රියාවලියක් මිස අනාතග ජීවිතය සඳහා සූදානම් වීමක් නොවන බව ද" පෙන්වා දී ඇත. ඒ අනුව වර්තමානයේ ජීවත්වීමට අධ්‍යාපනයෙන් ඉගැන්වේ. මහත්මා ගාන්ධිට අනුව අධ්‍යාපනය යනු "හිස, හදවත හා අත දියුණු කිරීම"යි.

### ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ඓතිහාසික පසුබිම

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය විකාශනය වූයේ බෞද්ධ පන්සල් හා හින්දු කෝවිල් ආශ්‍රිතවය. මුල් කාලයේ පූජ්‍ය පක්ෂයට සහ ඉහළ මට්ටමේ කුලයන්ට අයත් පුද්ගල කණ්ඩායම්වලට අධ්‍යාපනය සීමා විය. එම සාම්ප්‍රදායික පාසැල්වල විෂය මාලාවන් සමන්විත වූයේ ආගමික අධ්‍යයන, ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා වලිනි. එහි දී ඉගැන්වූ විෂයයන් අතර ලෝහ වැඩ, විවීම, ගෘහ නිර්මාණ ශිල්පය, ජ්‍යාමිතිය, කලාව හා චිත්‍ර ශිල්පය ද ප්‍රධාන විය. එහෙත් ජනගහනයෙන් බහුතරයකට අධ්‍යාපනයක් නොලැබුණු අතර,ඔවුහු අකුරු නොදත් පිරිසක් විය. පසු කාලීනව එක් එක් යුගවලදී ලංකාවට පැමිණි විදේශිකයින්ගේ පාලන ක්‍රම යටතේ අධ්‍යාපන ක්‍රමයන් වෙනසකට ලක් විය. 16 වන සියවසේ දී ශ්‍රී ලංකාව පෘතුගීසීන්ගේ පාලනයට නතු වූ විට රෝමානු කතෝලික ධර්මය ප්‍රවර්ධනය කිරීමට පාසැල් ගණනාවක් ආරම්භ කරන ලදි. ලන්දේසි පාලන සමයේ දි ක්‍රිස්තියානි ප්‍රාථමික පාසැල් පද්ධතියක් හඳුන්වා දෙන ලදි. 18 වන සියවසේ දි බ්‍රිතාන්‍යන් විසින් මෙරට අත්පත් කර ගැනීමෙන් පසුව ක්‍රිස්තියානි මිෂනාරී පාසැල්වල ඉගැන්වීමේ මාධ්‍ය ඉංග්‍රීසි මාධ්‍ය ලෙස වෙනස් කළ අතර, එම පාසැල්වලට සිසුන්ගේ පැමිණීම ඉතා අඩු මට්ටමක පැවති බව සඳහන් වේ. එයට හේතු වී ඇත්තේ ශ්‍රී ලාංකිකයින්ගෙන් බහුතරයක් ඉංග්‍රීසි භාෂාව නොදැන සිටීමයි.

1836 දී බ්‍රිතාන්‍යයන් විසින් රජයේ අරමුදල් සහිත පාසැල් පද්ධතියක් ස්ථාපිත කරන ලදි. වර්තමානය දක්වාම රජයේ අරමුදල් සහිත පාසැල් පද්ධතියක් ස්ථාපිත වීමට මෙය හේතුවක් වී ඇත.එම පාසැල්

පද්ධතිය තුළින් බිහි වූ බොහෝ පාසැල්වල සිසුන්ට සිංහල භාෂාවෙන් ඉගැන්වූ බැවින් එම පාසැල්වලට පැමිණෙන සිසුන්ගේ වර්ධනයක් සිදු විය. ශ්‍රී ලංකාවේ නූතන අධ්‍යාපන ක්‍රමය 19 වන සියවසේ දි ආරම්භ වූ අතර, එම සියවසේ අගභාගයේ දි තෘතීයික අධ්‍යාපන ආයතන පිහිටුවන ලදි. 1942 වර්ෂයේ දි පුද්ගලික පාසැල් හැර අනෙකුත් සියළුම පාසැල්වල ඉගැන්වීම් මාධ්‍යය ජාතික භාෂාව වන සිංහල භාෂාවට වෙනස් කළ අතර, සෑම දරුවකුටම තම ආගම අනුව ආගමික අධ්‍යාපනය ලැබුණි. මෙම කාලය තුළ බොහෝ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු වූ අතර, 1948 වර්ෂයේ නිදහසින් පසුව නව අධ්‍යාපන ආයතන කිහිපයකම බිහිවීම සිදු විය. එතැන් සිට මේ දක්වාම වරින් වර ජාත්‍යන්තර ප්‍රමිතීන් කරා ළඟාවීම උදෙසා විවිධ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කර ඇත.

මෙලොව එළිය දුටු සෑම පුද්ගලයෙක්ම ලබා ගන්නා වූ අධ්‍යාපනය විධිමත්, අවිධිමත් හා නොවිධිමත් ලෙසින් තෙයාකාරයකින් ලබා ගනියි. යම් පුද්ගලයෙක් ප්‍රාථමික අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා විධිමත් ආයතන තුළින් පූර්ණ කාලීනව ලබා ගන්නා අධ්‍යාපනය " විධිමත් අධ්‍යාපනය" ලෙස හැඳින්වේ.

ජීවත්වීමේදී දෛනික අත්දැකීම්, අධ්‍යාපනික ආභාෂයෙන් මෙන්ම පරිසරය තුළින් එනම් පවුල, දෙමාපිය, ඥාති, වැඩිහිටියන්ගෙන් හා රූපවාහිනියෙන්, අන්තර්ජාලයෙන්,ඉලෙක්ට්‍රොනික තැපැලෙන්, දුරකථනයෙන් හා සමාජ ආශ්‍රයෙන් ලබා ගන්නා අධ්‍යාපනය "අවිධිමත් අධ්‍යාපනයයි".

යම් සුවිශේෂී කණ්ඩායමක් ඉලක්ක කර ගනිමින් සුවිශේෂී අරමුණක් උදෙසා ලබාදෙන අධ්‍යාපනය "නොවිධිමත් අධ්‍යාපනය" ලෙස හැඳින්විය හැකිය. නූතනයට ඉතාම අත්‍යාවශ්‍ය අංගයක් ලෙස මෙය සැලකිය හැකි අතර, කුසලතා රහිත හා අර්ධ වශයෙන් කුසලතා සහිත පුද්ගලයන් වෙනුවෙන් කුසලතාවයන් ලබා දීමටත්, නවෝත්පාදන අවස්ථා සැලසීමටත්, විධිමත් අධ්‍යාපනයෙන් ගිලිහුණු පුද්ගලයන් සඳහා අධ්‍යාපන දොරටු විවරකර දීමටත් විධිමත් අධ්‍යාපනයේ ලද දැනුම හා කුසලතා වැඩි දියුණු කර ගැනීමට මංපෙත් විවර වීමත් මින් සිදුවන බැවින් කාලීන වශයෙන් වැඩි වැදගත්කමක් පවතින අධ්‍යාපන ක්‍රියාදාමයකි.

ශ්‍රී ලාංකීය සමාජ සංදර්භය තුළ අධ්‍යාපනය සම්බන්ධයෙන් කතිකාවතක් ගොඩනැගීමේදී 1996 ජැක් ඩෙලෝර්ස් ජාත්‍යන්තර කොමිෂන් වාර්තාව වැදගත් ස්ථානයක් අත්පත් කර ගනී. එම වාර්තාවේ දැක්වෙන පරිදි "දැනුම, ආකල්ප හා කුසලතා පුළුල් කර ගනිමින් අඛණ්ඩව වෙනස්වන සංකීර්ණ අන්තර් සබඳතා ඇති ලෝකයට හැඩ ගැසීමට හැකියාව ලබා ගැනීමට කළ යුත්තේ ස්ථම්භ 04ක් වටා ගොඩනැගී ඇති ඉගෙනුම් ක්‍රියාවලි සතරක්" අනුවය.

1. දැනුම ලබා ගැනීමට ඉගෙනුම
2. ක්‍රියාවේ නිරත වීමට ඉගෙනුම
3. අන්‍යයන් සමඟ ජීවත් වීමට ඉගෙනුම
4. දිවි පැවැත්ම සඳහා ඉගෙනුම

ලෝකය විශ්ව ගම්මානයක් බවට පත්වීම නිසා ඇතිවන දැනුම සන්නිවේදනය කිරීම, ගබඩා කිරීම, ප්‍රචාරණය කිරීම නිසා අධ්‍යාපනය තුළ අඛණ්ඩව දැනුම මතුවේ.

**අධ්‍යාපන ක්‍රමය සම්බන්ධයෙන් පවතින ලෝකයේ පෙරළිකාර ක්‍රමවේද**

නූතන ලෝකයේ අධ්‍යාපන ක්‍රමවේදයන් සම්බන්ධයෙන් අවධානය යොමු කරන කල්හි ඔවුන් වර්තමානය වන විට නිර්මාණශීලී කාර්යශූර හා දැනුම, ආකල්ප හා කුසලතා වලින් පරිපූර්ණ අනාගත පරපුරක් බිහිකරගෙන ඇතිබව නොරහසකි. 2020වන විට ලොකයේ හොඳම අධ්‍යාපන ක්‍රම සහිත රටවල් ලෙස කිරුළු පැළඳවූයේ ෆින්ලන්තය, ඩෙන්මාර්කය හා දකුණු කොරියාවයි. වර්තමානය වන විට ලෝක අධ්‍යාපනය  සඳහා වූ පියර්සන් දර්ශකයේ ඉහලම ස්ථානයක් හිමිකරගෙන ඇත්තේද ෆින්ලන්තයයි.

ෆින්ලන්ත අධ්‍යාපන ක්‍රමය නිර්මාණය වී ඇත්තේ සිසුවාට උපරිම නිදහස ලබා දෙමින් ඔවුන්ගේ දක්ෂතා පැහැදිලිව හඳුනාගෙන ඔප්නැංවීමට හැකි අයුරිනි. එහි සෑම දරුවෙකුටම මූලික අධ්‍යාපනය අනිවාර්ය වන අතර පාසැල් පොත් හා  සියළුම අධ්‍යාපනික උපකරණ හා දිවා ආහාරය රජය මඟින් නොමිලේ සපයනු ලබයි. වයස අවුරුදු 7 දී දරුවා 1 වසරට ඇතුලත් කරන අතර, වයස අවුරුදු 17 දී පවත්වන පොදු  පරීක්ෂණයත් සමඟ ඔවුන්ගේ මූලික අධ්‍යාපනය අවසන් වේ.

අනෙකුත් රටවල් මෙන් නොව ෆින්ලන්තයේ ගුරු වෘත්තියට ඇතුලත් වීම ද පහසු කාර්යයක් නොවේ. ළමා මනෝ විද්‍යාව පිළිබඳ දැනුම ද, පශ්චාත් උපාධියක් ද, අදාල විෂය සම්බන්ධයෙන් පශ්චාත් උපාධියක් ද ගුරු වෘත්තියට තිබිය යුතු අතර ගුරු වෘත්තිය සඳහා විශාල පිළිගැනීමක් එරට පවතී.

උසස් අධ්‍යාපනය සඳහාද ෆින්ලන්ත රජය ප්‍රතිපාදන වෙන් කරන අතර, විශ්ව විද්‍යාලයට තෝරා ගැනීමේ දී ප්‍රමුඛතාවය ලබාදෙන්නේ මූලික අධ්‍යාපනය අවසානයේ පවත්වන තරඟ විභාගයේ ලකුණු ද ඇතුළත්වීමේ විභාගයේ ලකුණු හා ඇගයීම්වලට ලබාගන්නා ලකුණු පදනම් කර ගනිමිනි.


ෆින්ලන්ත දරුවන්ට මුල්කාලයේ සිටම ඔවුන්ගේ සිත්සතන්වලට වෘත්තීන්වල උස් පහත් භාවය යන හිස් ආකල්ප ඇතුලත් කර නොමැත. සිය පාසැලේ ගත කරන පැය ප්‍රමාණය අඩු වීමත්, නිවසේ දී සිදු කිරීමට නියමිත වැඩ ප්‍රමාණය අඩුවීමත් තුළින් දරුවන්ට සිය ජීවිතය නිදහසේ විඳිමින් ගවේශනයෙන් ඉගෙන ගැනීමට අවකාශ ඇති නිසාත් දැනුම, ආකල්ප හා කුසලතා වලින් හෙබි පූර්ණ පුද්ගලයෙකු බිහිවන්නේ නිතැතිණි. ෆින්ලන්තයේ සාක්ෂරතාවය 100% වන අතර ශ්‍රම බලකායෙන් 84%  ක් උසස් අධ්‍යාපනය ලබා සිටින අය වීමත් 39% පශ්චාත් උපාධි මට්ටමේ සිටීමත් විශේෂ ලක්ෂණයකි.

අධ්‍යාපනය සියළු දෙනාගේ මූලික අයිතිවාසිකමකි. එය සමාජ සමානාත්මතාවයේ සමාජ සංචලතාවය හා පුද්ගල කණ්ඩායම්වල අයිතීන් සුරක්ෂිත කර ගැනීමේදී වැදගත් මාධ්‍යයක් ලෙස ක්‍රියා කරනු ලබයි.

දරුවෙකුට අධ්‍යාපන ක්‍රමය හඳුන්වාදෙන ප්‍රථම අවස්ථාව වන්නේ මුල් ළමාවිය අධ්‍යාපනයයි. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය 1-5 ශ්‍රේණි දක්වා ආවරණය කරන අතර, 6-13 වසර දක්වා ද්විතියික

අධ්‍යාපනය ආවරණය කරයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ අදියර විකාශනය වන ආකාරය පහත රූප සටහන මගින් පැහැදිලි කෙරේ.

**ශ්‍රී ලාංකීය අධ්‍යාපන හා පුහුණු කිරීමේ ක්‍රමවේදයේ සංවිධාන සටහන**



අපගේ අධ්‍යාපන ක්‍රමය තුල අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය හා අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය තීරණාත්මක විභාගයන් දෙකකි. 2019 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සඳහා ඉදිරිපත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාව 556,256 වන අතර, ඉන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයින් සංඛ්‍යාව 236,099 කි. (70.59%) අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂිතයින් සංඛ්‍යාව 187,167 වන අතර විෂයන් තුනම සමත් වූ සංඛ්‍යාව 113,637 ක් වේ.

2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සමුළුවේදී ඉදිරි වසර 15 සඳහා ඉදිරිපත් කරන ලද තිරසාර සංවර්ධන අභිමතාර්ථ තුලින්ද "පරිපූර්ණ සහ සාධාරණ අධ්‍යාපනයක් සුරක්ෂිත කිරීම සහ සැමට ජීවිත කාලය පුරා අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට " අදාල ඉලක්ක රැසක් ඉදිරිපත් කර ඇත.

අධ්‍යාපනය සම්බන්ධයෙන් සලකා බලන කල ඉගැන්වීමේ ප්‍රවේශයද වැදගත් වේ. ඉගෙනීමේ න්‍යායයන්, සිසුන්ගේ අවබෝධය හා ඔවුන්ගේ අවශ්‍යතා හා පසුබිම සැලකිල්ලට ගනිමින් ගුරුවරයා විසින් අනුගමනය කරනු ලබන ඉගැන්වීමේ ක්‍රමවේදයන් වෙනස්ය. එහිදී Andragogy හා Pedagogy වශයෙන් ප්‍රධාන ක්‍රම 2 ක් පවතී. Andragogy යනු වැඩිහිටි අධ්‍යාපනයේ භාවිතා වන ක්‍රම හා මූලධර්ම වේ. මෙම සංකල්පය බිහි වී ඇත්තේ "andr-මිනිසා" හා "agogos-නායකයා" යන ග්‍රීක වචනයෙනි. එහි අර්ථය වන්නේ "ප්‍රමුඛ මිනිසා" වන අතර ඉගැන්වීම යන අර්ථය ඉන් නිරූපණය කරයි. මෙම ක්‍රමයේදී පුහුණුකරු / ගුරුවරයා /උපදේශකයා මත රඳා පවතින අතර ඔහු ඉගෙනුම් පහසුකම් සැපයුම සිදු කරනු ලබයි. එමෙන්ම තම දැනුම හෝ ලබා ගත් දැනුම යොදා ගන්නේ පුහුණුවෙන් පසුව හෝ පුහුණුවෙන් පසු ඉතාම ආසන්න කාල වකවානුවේදීය. සම කණ්ඩායම් තුලින් බොහෝ දුරට ඉගෙන ගැනීම සිදු කරන අතර, එම පුද්ගලයාගේ ආකල්ප ඉගෙනුම කණ්ඩායම් හා ඉගෙනුම් වටපිටාව ඉගෙනුම සාර්ථක වීමට බලපායි.

Pedagogy යටතේ ලබාගත් දැනුම හා කුසලතා උපයෝගී කර ගනු ලබන්නේ කාල පරාසයකින් පසුව වන අතර ගුරුවරයාගේ දක්ෂතාවය හා ආකල්ප මත එය රඳා පවතී. ගුරුවරයාට පාලනය කර ගත හැකි සන්දර්භයක් තුල රඳා පවතින අතර අනුවරයන් හා සහවරයන් අතරින් ඉගෙන ගැනිම අඩු මට්ටමක පවතී.

92.9 % වඩා ඉහළ සාක්ෂරතා මට්ටමක් පවතින ශ්‍රී ලංකාවේ දැනුම් කේන්ද්‍රීය සමාජයක් සංවර්ධනය කර ආර්ථික මට්ටම ඉහළ නැංවීමට කටයුතු කිරීම අත්‍යවශ්‍යම කර්තව්‍යයකි. අධ්‍යාපනය තුලින් දේශීය හා විදේශීය ශ්‍රමවෙළඳපොල ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු සැලසුම් සහගතව ලබා දීමත් , ජාතික සංවර්ධනයට සැම පුරවැසියෙකුම දායක කර ගැනීමටත් හැකි වන ලෙස දොරටු විවෘත කල යුතුය.

**අධ්‍යාපනයේ දර්ශනය හා ක්‍රමවේදය**

පාසැල් අධ්‍යාපනයේ පවතින ගැටළු මොනවාද ?

මෙහිදී මූලික වශයෙන් බුද්ධි කලම්භන සැසිය මඟින් වර්තමාන අධ්‍යාපන ක්‍රමයේ පවතින ගැටළු හා දුර්වලතාවයන් හඳුනා ගන්නා ලද අතර එ්වා පහත පරිදි වේ.

1. සමාජ අසාධාරණත්වය
2. සම්පත් සම නොවීම
3. පූර්ණ මානව සංවර්ධනය සිදු නොවීම
4. විෂය නොදන්නා පිරිසක් හැසිරවීම (ආකල්ප, කුසලතා, යාවත්කාලීන දැනුම)
5. ග්‍රාමීය වතු අංශයේ නුපුහුණු ගුරුවරුන් සේවය කිරීම
6. සංකලනය හා අනන්‍යතාවය අතර සුසංයෝගයක් නොවීම
7. දරුවාගේ අභිරුචියට (Passion) ඉඩ නොදීම
8. විභාග කට සීමා වූ අධ්‍යාපනය
9. ප්‍රධාන වශයෙන් පොතෙහි දැනුමට පමණක් සීමා වූ අධ්‍යාපනය හා එහි අන්තර්ගතය
10. රාමුගතයි
11. දරුවන්ට ඇහුම්කන් නොදීම
12. පාඩම් කර විභාග ලිවීම ළමුන්ගේ නිදහස් චින්තනය එහි දී ලබා ගැනීම අවම වීම
13. තොරතුරු කටපාඩම් කිරීම හා ගණිත කර්මවලට වැඩි කාලයක් වැය වීම නිසා මානුෂීය ගුණ දහම්, කලා, චින්තන සඳහා වේලාව නොමැතිවීම
14. පවතින අධ්‍යාපන ක්‍රමය ප්‍රතිඵල හා ඉලක්ක පාදක කරගෙන තිබීම
15. පවතින අධ්‍යාපන ක්‍රමය දරුවන්ට ආතතියක් වීම
16. තමන්ව සොයා යාමට ඉඩ නොදීම
17. ශිෂ්‍ය විභවතාවයන් වර්ධනයට අවකාශ නොතිබීම
18. දරුවාට සැබෑ පරිසරයක් අත්විඳීමට අවකාශ ලබා නොදීම
19. තොරතුරු මත සැකසුණු අධ්‍යාපන ක්‍රමවේදය වෙනුවට ජීවිත අත්දැකීම් මත අධ්‍යාපන ක්‍රමය සැකසී නොතිබීම.
20. අධ්‍යාපනයක් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් නොමැතිවීම
21. ළමයාට අවශ්‍ය දේ නොව උගතුන්ගේ දැනුම පෙන්වීමට විෂය මාලාවන් සකස් කිරීම
22. යටත්විජිතවාදයට අවශ්‍ය අධ්‍යාපන ක්‍රමයම දිගටම අනුගමනය කිරීම
23. ඉන්ද්‍රිය ගෝචර නොවීම
24. නිර්මාණශීලිත්වය පූර්ණ ලෙස ඇගයීමක් නොවීම
25. වයසින් වැඩෙත්ම දරුවන්ට තමන්ගේ හැකියාව සොයා ගැනීමට ඇති අවකාශය සීමා වීම හෝ නැතිවීම
26. විෂයය දැනුම ප්‍රායෝගික ජීවිතයේ දී භාවිතා වීම අවම වීම

27. පන්තියක ළමුන් සංඛ්‍යාව ඉතා වැඩි හෝ ඉතා අඩු වීම
28. ගුරුවරුන්ගේ වෘත්තීයභාවය නොසැලකීම
29. දෙමාපිය අධ්‍යාපනයට තැනක් නොමැතිවීම.
30. ඉගෙනුමට දරුවා පෙර සූදානම් කිරීමක් නොමැති වීම
31. අධ්‍යාපනයේ වෘත්තිකභාවය
32. ක්ෂණික විචල්‍යතාවයන් නැතිකම , Inclusive Education
33. පිරිමි ළමුන් අභිබවා ගැහැණු ළමුන් දක්ෂතා පෙන්වීම
34. ජන විඥාණයට ඉඩ නොදීම
35. අධ්‍යාපනය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව පැවතීම
36. පාසැල් වත්කම්/ භූමිය බාහිර පාර්ශ්වයන්ගේ පාලනයට නතුවීම

අධ්‍යාපන ක්‍රමයේ හඳුනා ගත් ගැටළු හා දුර්වලතාවයන් අවම කර ගැනීම සඳහා ඉගැන්වීම් ක්‍රමවේදයන් සිදු විය යුතු ආකාරය පහත පරිදි දැක්විය හැකිය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

- ගුරුවරයා වෘත්තිකයෙක් වීම හා සෑම පාසලක්ම එක ප්‍රමිතියක් වීමේ පදනම මත සියළුම ප්‍රතිපත්තීන් සකස් වී තිබිය යුතු ය.
  සියලු සමාජ ප්‍රශ්න මෙම සංකල්පයට අදාළව සකස් වී තිබීම.
- අධ්‍යාපන මනෝ විද්‍යාව අනුව පදනම් වූ මිශ්‍ර වයස් කාණ්ඩායම් අනුව පන්ති කාමර සකස් විය යුතු ය.
  මුල් ළමා විය අවු: 6-8
  පශ්චාත් ළමා විය අවු:9-12
  නව යොවුන් විය අවු:13-16 ( පියාජේ ගේ සංකල්පය අනුව )
  පශ්චාත් යොවුන්විය අවු:17-19
- අන්තර්කරණ අධ්‍යාපනය පදනම් වූ පන්ති කාමර සකස් විය යුතු ය.
- ගුරු ශිෂ්‍ය අනුපාතය 1:5 අනුපාතයෙන් විය යුතු ය.( ළමුන් 15 ක පන්තිකාමරයක් සඳහා ප්‍රධාන ගුරුවරයා සහ සහායක ගුරුවරුන් 03 ක් සිටිය යුතු ය )

සමෝධානික අධ්‍යාපන ක්‍රමය

- අත්දැකීම් හා තේමා පාදක අධ්‍යාපන ක්‍රමයකි
- දරුවන්ගේ විවිධත්වය හඳුනා ගැනීම
  වාචික බුද්ධිය, තර්කානුකූල බුද්ධිය ,සංගීත රිද්මයානුකූල, ස්වභාව ධර්ම පදනම් වූ (බහුවිධ බුද්ධි න්‍යාය) දරුවාගේ කුසලතා අභිරුචීන් හඳුනා ගැනීම
- ඒ ඔස්සේ දරුවා අඛණ්ඩව තක්සේරු වෙමින් නියාමනය වෙමින් ඉදිරියට යයි.
- ගුරුවරයා දරුවා නිරීක්ෂණය කරමින් වාර්තා තබා ගැනීම (මෙම වාර්තා දරුවා සමඟ ඉදිරියට යයි.)
- තමාගේ විභවතාවයන් හඳුනා දියුණුකරගෙන ඇති නිසා ඊට අදාළ වෘත්තීය වරණය සිදු කර ගැනීම.
- මින් අවධාරණය වන්නේ යාවජීව ඉගෙනුම් ක්‍රියාවලියක් මගින් අභියෝග ජය ගැනීමේ හැකියාවයි.

දැනුම් කේන්ද්‍රීය සමාජයක් සංවර්ධනය කර ආර්ථික මට්ටම ඉහළට ගැනීමේ දී විධිමත් අධ්‍යාපනයට පැවරෙනුයේ මහඟු කාර්යභාරයකි.එවන් තත්වයක් තුළ අධ්‍යාපන ක්‍රමයේ සිදුවිය යුතු වෙනස්කම් හා යෝජනා පහත පරිදි වේ.

<u>ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා</u>

- රට වැසියා මූලික කර ගත් පාසල්/ අධ්‍යාපන ව්‍යුහයක් (ජාති ආගම් වෙන්ව නොමැති) ඇති කිරීම.
- අක්ෂර සාක්ෂරතා අධ්‍යාපනය වයස අවු 7 න් ආරම්භ කිරීමට කටයුතු කිරීම.
- ළඟම පාසල දරුවාගේ පාසල වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම
- ශිෂ්‍යත්ව විභාගය අහෝසි කිරීම
- මිශ්‍ර පාසල් ඇති කිරීම
- ගුරුවරයා උපාධිධාරී වීම හා ඉගෙනුම් බලපත්‍රලාභියෙක් විය යුතුය
- එම බලපත්‍ර යාවත්කාලීන කිරීම
- ශිෂ්‍ය තක්සේරුව වාර්ෂිකව සිදු කිරීම
  ප්‍රායෝගික පරීක්ෂණ සඳහා - 60%
  ලිඛිත පරීක්ෂණ සඳහා - 40%
- වෘත්තීය අධ්‍යාපනය පාසල් පද්ධතියට ගෙන ඒම
- පාරිසරික අධ්‍යාපන විෂය උසස්පෙළ විෂයට ඇතුළත් කිරීම
- පරිකල්පනය/ නිර්මාණශීලීත්වය / නවෝත්පාදන පරිසරය වැඩි දියුණු කිරීම
- ආගම් විෂය සියලු ආගම්/දෘෂ්ඨී ඇතුළත් සමයාන්තර ඥානය ලබා දීම
- ක්‍රීඩා හා සෞන්දර්යය මූලික විෂය කාණ්ඩය තුළට ගැනීම
- අනිවාර්යය අධ්‍යාපනය 10 ශ්‍රේණිය කිරීම
- සාමාන්‍ය පෙළ මඟින් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය තෝරා ගැනීම සඳහා අවකාශ දීම
- අඛණ්ඩ අධ්‍යාපන ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
- මිශ්‍ර අධ්‍යාපනයේ ඇති වැදගත්කම පිළිබඳව සමාජ කතිකාවතක් ඇති කිරීම
- ජනප්‍රිය අමිශ්‍ර පාසල් සංකල්පය වෙනුවට මිශ්‍ර පාසල් ඇති කිරීම
- ආගම් අනුව පාසල් බෙදා වෙන් නොකිරීම
- සමස්ත මානව හැකියාවන්ගේ පරාසය අවබෝධ කර ගෙන ඊට සුදුසු විෂය නිර්දේශ හා ඇගයීම් ක්‍රමයක් ඇති කිරීම
- විෂය නිර්දේශය තුළට දේශීය දැනුම් පද්ධතීන්, වටිනාකම් පද්ධතීන් පරිග්‍රහණය කිරීම.
- සම අධ්‍යාපන අවස්ථා පාසල් පද්ධතිය තුළ ඇති කිරීම
- පාසල තුළ අසාධාරණ ලෙස සිදු වන විශේෂිත සැලකීම් අවම කිරීම
- පහත සඳහන් කරුණු පිළිබඳව දෙමාපිය දැනුවත් කිරීමට වැඩ පිළිවෙළක් සැකසීම

- ළමයාගේ හැකියාවන්, විභාගතාවයන් , ලැදියාවන් හඳුනා ගැනීමේ වැදගත්කම
- ජාතික තලයේ විභාගයක් අසමත් වීම දරුවෙකුගේ පූර්ණ හැකියාව මැනීමේ මිනුම් දණ්ඩක් නොවන බව.
- විකල්ප අධ්‍යාපන අවස්ථා ඇතිබව (Polytechnique education)
- දරුවෙකුගේ විභාග සමත් වීම පමණක් නොව මානුෂීය ගුණධර්ම ද වැදගත් බව.
- සෞඛ්‍යය සනීපාරක්ෂාව හා අනාචාර පිළිබඳ දෙමාපිය දැනුම වර්ධනය

# ඇමුණුම

## (1) **Performance of Candidates – GCE O/L**

### G.C.E.(O.L.) Examination - 2019
### Performance of Candidates

| Description | School Candidates (1st Attempt) | | All School Candidates | | Private Candidates | | All Candidates | |
|---|---|---|---|---|---|---|---|---|
| | Number | % | Number | % | Number | % | Number | % |
| No. Sat | 305633 | | 388460 | | 167796 | | 556256 | |
| No. Sat (5 or More subjects) | 305427 | | 315278 | | 19196 | | 334474 | |
| Qualified for (A.L.) | 225539 | 73.84 | 227872 | 72.28 | 8221 | 42.83 | 236093 | 70.59 |
| Passed in 6 or more (including 1st Lan. & Maths) with 3 credits | 201128 | 65.85 | 202575 | 64.25 | 6214 | 32.37 | 208789 | 62.42 |
| Obtained 9 "A" passes | 10201 | 3.34 | 10201 | 3.24 | 145 | 0.76 | 10346 | 3.09 |
| Failed in All Subjects (Appeared for 6 or more Subjects) | 7007 | 2.29 | 7382 | 1.90 | 1004 | 0.60 | 8386 | 1.51 |

Source: Dept. of Examinations, 2019

(2).

### G.C.E. (O.L) Examinations 2018 - 2019
### Performance of School Candidates (1st Attempt) by Province arranged in Descending Order of Qualified Percentage

**2018**

| | Province | Number Sat for 5 or more subjects | Qualified for G.C.E.(A/L) | | Failed in All Subjects (Appeared for 6 or more Subjects) | |
|---|---|---|---|---|---|---|
| | | | No. | % | No. | % |
| 1 | Southern | 36,720 | 29,532 | 80.42 | 409 | 1.11 |
| 2 | North Western | 34,564 | 26,599 | 76.96 | 541 | 1.57 |
| 3 | Western | 78,071 | 59,858 | 76.67 | 1,595 | 2.04 |
| 4 | Sabaragamuwa | 27,294 | 20,784 | 76.15 | 558 | 2.04 |
| 5 | North Central | 19,395 | 14,116 | 72.78 | 497 | 2.56 |
| 6 | Uva | 19,679 | 14,245 | 72.39 | 474 | 2.41 |
| 7 | Central | 39,625 | 28,680 | 72.38 | 894 | 2.26 |
| 8 | Nothern | 16,659 | 11,660 | 69.99 | 425 | 2.55 |
| 9 | Eastern | 24,022 | 16,807 | 69.97 | 524 | 2.18 |
| | **All Island** | **296,029** | **222,281** | **75.09** | **5,917** | **2.00** |

**2019**

| | Province | Number Sat for 5 or more subjects | Qualified for G.C.E.(A/L) | | Passed in 6 or more (including 1st Lan. & Maths) with 3 credits | | Failed in All Subjects (Appeared for 6 or more Subjects) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | No. | % | No. | % | No. | % |
| 1 | Southern | 38,180 | 29,898 | 78.31 | 26,333 | 68.97 | 613 | 1.60 |
| 2 | Western | 79,835 | 60,671 | 76.00 | 55,439 | 69.44 | 1,829 | 2.29 |
| 3 | North Western | 35,669 | 26,849 | 75.27 | 24,110 | 67.59 | 672 | 1.88 |
| 4 | Sabaragamuwa | 28,683 | 21,513 | 75.00 | 19,573 | 68.24 | 641 | 2.23 |
| 5 | North Central | 20,465 | 14,690 | 71.78 | 12,753 | 62.32 | 638 | 3.11 |
| 6 | Central | 40,717 | 28,886 | 70.94 | 25,030 | 61.47 | 945 | 2.32 |
| 7 | Eastern | 24,215 | 17,012 | 70.25 | 14,834 | 61.26 | 602 | 2.48 |
| 8 | Uva | 21,041 | 14,761 | 70.15 | 12,950 | 61.55 | 629 | 2.99 |
| 9 | Northern | 16,622 | 11,259 | 67.74 | 10,106 | 60.80 | 438 | 2.63 |
| | **All Island** | **305,427** | **225,539** | **73.84** | **201,128** | **65.85** | **7,007** | **2.29** |

Source: Dept. of Examinations, 2019

(3).

**G.C.E. (O.L) Examinations 2014 - 2019**

**School Candidates (1st Attempt) Qualified for C.C.E.(A.L.) by District**

| | District | 2014 | | | 2015 | | | 2016 | | | 2017 | | | 2018 | | | 2019 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Number Sat for 5 or more subjects | Qualified for G.C.E.(A/L) | | Number Sat for 5 or more subjects | Qualified for G.C.E.(A/L) | | Number Sat for 5 or more subjects | Qualified for G.C.E.(A/L) | | Number Sat for 5 or more subjects | Qualified for G.C.E.(A/L) | | Number Sat for 5 or more subjects | Qualified for G.C.E.(A/L) | | Number Sat for 5 or more subjects | Qualified for G.C.E.(A/L) | |
| | | | No. | % | | No. | % | | No. | % | | No. | % | | No. | % | | No. | % |
| 1 | Colombo | 29,019 | 22,142 | 76.30 | 31,085 | 23,649 | 76.08 | 31,933 | 24,382 | 76.35 | 33,231 | 26,018 | 78.29 | 32,686 | 26,213 | 80.20 | 32,771 | 25,919 | 79.09 |
| 2 | Gampaha | 24,764 | 17,027 | 68.76 | 26,665 | 18,679 | 70.05 | 27,719 | 19,556 | 70.55 | 28,531 | 20,422 | 71.58 | 28,375 | 20,995 | 73.99 | 29,553 | 22,024 | 74.52 |
| 3 | Kalutara | 14,310 | 9,834 | 68.72 | 15,267 | 10,734 | 70.31 | 15,762 | 11,056 | 70.14 | 16,946 | 12,264 | 72.37 | 17,010 | 12,650 | 74.37 | 17,511 | 12,728 | 72.69 |
| 4 | Kandy | 18,660 | 12,862 | 68.93 | 18,813 | 13,266 | 70.52 | 20,197 | 14,632 | 72.45 | 20,986 | 15,520 | 73.95 | 21,414 | 16,127 | 75.31 | 21,629 | 16,038 | 74.15 |
| 5 | Matale | 6,332 | 4,080 | 64.43 | 6,415 | 4,210 | 65.63 | 7,109 | 4,911 | 69.08 | 7,312 | 5,154 | 70.49 | 7,253 | 5,261 | 72.54 | 7,641 | 5,403 | 70.71 |
| 6 | Nuwara Eliya | 9,093 | 5,539 | 60.91 | 9,424 | 5,733 | 60.83 | 10,359 | 6,389 | 61.68 | 10,679 | 7,164 | 67.08 | 10,958 | 7,292 | 66.54 | 11,447 | 7,445 | 65.04 |
| 7 | Galle | 14,723 | 10,833 | 73.58 | 14,935 | 11,138 | 74.58 | 14,777 | 11,177 | 75.64 | 15,540 | 12,211 | 78.58 | 15,562 | 12,274 | 78.87 | 16,198 | 12,359 | 76.30 |
| 8 | Matara | 10,582 | 7,792 | 73.63 | 11,358 | 8,629 | 75.97 | 11,438 | 8,950 | 78.25 | 11,772 | 9,421 | 80.03 | 12,038 | 9,871 | 82.00 | 12,315 | 9,756 | 79.22 |
| 9 | Hambantota | 7,840 | 5,598 | 71.40 | 8,508 | 6,406 | 75.29 | 8,779 | 6,701 | 76.33 | 8,913 | 7,136 | 80.06 | 9,120 | 7,387 | 81.00 | 9,667 | 7,783 | 80.51 |
| 10 | Jaffna | 8,657 | 5,578 | 64.43 | 9,776 | 6,119 | 62.59 | 9,433 | 5,847 | 61.98 | 9,176 | 6,219 | 67.77 | 8,495 | 6,096 | 71.76 | 8,520 | 5,902 | 69.27 |
| 11 | Kilinochchi | 1,649 | 861 | 52.21 | 2,177 | 1,011 | 46.44 | 2,105 | 1,038 | 49.31 | 2,484 | 1,420 | 57.17 | 2,157 | 1,302 | 60.36 | 2,254 | 1,364 | 60.51 |
| 12 | Mannar | 1,287 | 971 | 75.45 | 1,648 | 1,125 | 68.26 | 1,715 | 1,090 | 63.56 | 1,751 | 1,251 | 71.44 | 1,631 | 1,227 | 75.23 | 1,607 | 1,200 | 74.67 |
| 13 | Vavuniya | 2,277 | 1,612 | 70.79 | 2,533 | 1,623 | 64.07 | 2,540 | 1,660 | 65.35 | 2,704 | 1,853 | 68.53 | 2,543 | 1,853 | 72.87 | 2,545 | 1,723 | 67.70 |
| 14 | Mullaitivu | 1,396 | 778 | 55.73 | 1,618 | 841 | 51.98 | 1,620 | 927 | 57.22 | 1,884 | 1,158 | 61.46 | 1,833 | 1,182 | 64.48 | 1,696 | 1,070 | 63.09 |
| 15 | Batticaloa | 6,445 | 4,274 | 66.31 | 7,171 | 4,590 | 64.01 | 8,098 | 4,708 | 58.14 | 8,055 | 5,276 | 65.50 | 8,095 | 5,564 | 68.73 | 8,044 | 5,584 | 69.42 |
| 16 | Ampara | 8,751 | 6,038 | 69.00 | 8,869 | 5,995 | 67.59 | 9,814 | 6,600 | 67.25 | 10,160 | 7,318 | 72.03 | 10,021 | 7,437 | 74.21 | 10,307 | 7,644 | 74.16 |
| 17 | Trincomalee | 4,968 | 3,139 | 63.18 | 5,653 | 3,199 | 56.59 | 5,832 | 3,309 | 56.74 | 6,065 | 3,858 | 63.61 | 5,906 | 3,806 | 64.44 | 5,864 | 3,784 | 64.53 |
| 18 | Kurunegala | 20,490 | 14,758 | 72.03 | 21,730 | 15,729 | 72.38 | 23,242 | 17,046 | 73.34 | 24,146 | 18,538 | 76.77 | 23,871 | 18,873 | 79.06 | 24,853 | 19,284 | 77.59 |
| 19 | Puttalam | 9,244 | 6,180 | 66.85 | 10,003 | 6,375 | 63.73 | 10,591 | 6,850 | 64.68 | 10,606 | 7,388 | 69.66 | 10,693 | 7,726 | 72.25 | 10,816 | 7,565 | 69.94 |
| 20 | Anuradhapura | 11,444 | 7,493 | 65.48 | 11,545 | 7,839 | 67.90 | 13,209 | 8,844 | 66.95 | 13,435 | 9,486 | 70.61 | 13,531 | 9,909 | 73.23 | 14,294 | 10,292 | 72.00 |
| 21 | Polonnaruwa | 4,860 | 3,145 | 64.71 | 5,015 | 3,191 | 63.63 | 5,832 | 3,788 | 64.95 | 6,020 | 4,139 | 68.75 | 5,864 | 4,207 | 71.74 | 6,171 | 4,398 | 71.27 |
| 22 | Badulla | 11,424 | 7,573 | 66.29 | 12,039 | 8,069 | 67.02 | 12,254 | 8,482 | 69.22 | 12,761 | 9,068 | 71.06 | 12,770 | 9,462 | 74.10 | 13,696 | 9,772 | 71.35 |
| 23 | Monaragala | 5,641 | 3,488 | 61.83 | 6,192 | 3,936 | 63.57 | 6,304 | 4,148 | 65.80 | 6,710 | 4,505 | 67.14 | 6,909 | 4,783 | 69.23 | 7,345 | 4,989 | 67.92 |
| 24 | Ratnapura | 13,167 | 8,750 | 66.45 | 13,784 | 9,375 | 68.01 | 13,965 | 9,735 | 69.71 | 14,862 | 10,915 | 73.44 | 15,226 | 11,504 | 75.55 | 16,314 | 12,110 | 74.23 |
| 25 | Kegalle | 10,299 | 7,267 | 70.56 | 11,001 | 7,967 | 72.42 | 11,624 | 8,382 | 72.11 | 12,083 | 9,113 | 75.42 | 12,068 | 9,280 | 76.90 | 12,369 | 9,403 | 76.02 |
| **All Island** | | **257,322** | **177,612** | **69.02** | **273,224** | **189,428** | **69.33** | **286,251** | **200,208** | **69.94** | **296,812** | **216,815** | **73.05** | **296,029** | **222,281** | **75.09** | **305,427** | **225,539** | **73.84** |

Source: Dept. of Examinations, 2019

(4) **Performance of Candidates – GCE A/L**

## G.C.E.(A.L.) Examination - 2019 (NEW)
## Performance of Candidates - All Island

| Description | School Candidates | | | | | | All Candidates | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Male | | Female | | Total | | Male | | Female | | Total | |
| | Number | % | Number | % | Number | % | Number | % | Number | % | Number | % |
| No. Applied | 79,376 | | 99,992 | | 179,368 | | 87,766 | | 109,583 | | 197,349 | |
| Number Sat | 76,148 | 95.93 | 97,633 | 97.64 | 173,781 | 96.89 | 81,912 | 93.33 | 105,255 | 96.05 | 187,167 | 94.84 |
| Passed in 3 Subjects (Eligible for University Entrance) | 38,659 | 50.77 | 69,694 | 71.38 | 108,353 | 62.35 | 40,482 | 49.42 | 73,155 | 69.50 | 113,637 | 60.71 |
| Obtained 3 A's | 1,701 | 2.23 | 3,723 | 3.81 | 5,424 | 3.12 | 1,732 | 2.11 | 3,802 | 3.61 | 5,534 | 2.96 |
| Passed in 2 subjects | 14,909 | 19.58 | 14,497 | 14.85 | 29,406 | 16.92 | 16,124 | 19.68 | 16,244 | 15.43 | 32,368 | 17.29 |
| Passed in 1 subjects | 12,257 | 16.10 | 8,275 | 8.48 | 20,532 | 11.81 | 13,406 | 16.37 | 9,837 | 9.35 | 23,243 | 12.42 |
| Failed in All subjects | 10,323 | 13.56 | 5,167 | 5.29 | 15,490 | 8.91 | 11,903 | 14.53 | 6,016 | 5.72 | 17,919 | 9.57 |

Source: Dept. of Examinations, 2019

(5).

## G.C.E.(A.L.) Examination - 2019 (OLD)
## Performance of Candidates - All Island

| Description | School Candidates | | | | | | All Candidates | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Male | | Female | | Total | | Male | | Female | | Total | |
| | Number | % | Number | % | Number | % | Number | % | Number | % | Number | % |
| No. Applied | 31,826 | | 50,750 | | 82,576 | | 52,700 | | 83,586 | | 136,286 | |
| Number Sat | 23,241 | 73.03 | 38,528 | 75.92 | 61,769 | 74.80 | 34,816 | 66.06 | 59,803 | 71.55 | 94,619 | 69.43 |
| Passed in 3 Subjects (Eligible for University Entrance) | 16,002 | 68.85 | 30,550 | 79.29 | 46,552 | 75.36 | 22,580 | 64.86 | 44,909 | 75.09 | 67,489 | 71.33 |
| Obtained 3 A's | 430 | 1.85 | 731 | 1.90 | 1,161 | 1.88 | 549 | 1.58 | 957 | 1.60 | 1,506 | 1.59 |
| Passed in 2 subjects | 3,506 | 15.09 | 4,331 | 11.24 | 7,837 | 12.69 | 5,568 | 15.99 | 7,811 | 13.06 | 13,379 | 14.14 |
| Passed in 1 subjects | 2,176 | 9.36 | 2,349 | 6.10 | 4,525 | 7.33 | 3,656 | 10.50 | 4,616 | 7.72 | 8,272 | 8.74 |
| Failed in All subjects | 1,559 | 6.71 | 1,296 | 3.36 | 2,855 | 4.62 | 3,011 | 8.65 | 2,468 | 4.13 | 5,479 | 5.79 |

Source: Dept. of Examinations, 2019

(6).

**G.C.E.(A.L.) Examination - 2019 (NEW)**
**Percentage of Candidates Eligible for University Entrance by Stream**

| Stream | School Candidates | | | All Candidates | | |
|---|---|---|---|---|---|---|
| | Number Sat | Passed in All 3 subjects (Eligible for University Entrance) | | Number Sat | Passed in All 3 subjects (Eligible for University Entrance) | |
| | | Number | % | | Number | % |
| 1. Bio Science | 19889 | 10772 | 54.16 | 20287 | 10882 | 53.64 |
| 2. Physical Science | 19218 | 9975 | 51.90 | 19508 | 10089 | 51.72 |
| 3. Commerce | 43645 | 29309 | 67.15 | 46206 | 30180 | 65.32 |
| 4. Arts | 69297 | 45675 | 65.91 | 77774 | 49011 | 63.02 |
| 5. Engineering Technology | 12487 | 7125 | 57.06 | 13301 | 7563 | 56.86 |
| 6. Bio Systems Technology | 6385 | 4307 | 67.45 | 6782 | 4578 | 67.50 |
| 7. Other | 2860 | 1190 | 41.61 | 3309 | 1334 | 40.31 |
| **Total** | **173781** | **108353** | **62.35** | **187167** | **113637** | **60.71** |

Source: Dept. of Examinations, 2019

**G.C.E.(A.L.) Examination - 2019 (OLD)**
**Percentage of Candidates Eligible for University Entrance by Stream**

| Stream | School Candidates | | | All Candidates | | |
|---|---|---|---|---|---|---|
| | Number Sat | Passed in All 3 subjects (Eligible for University Entrance) | | Number Sat | Passed in All 3 subjects (Eligible for University Entrance) | |
| | | Number | % | | Number | % |
| 1. Bio Science | 15883 | 11476 | 72.25 | 25599 | 18157 | 70.93 |
| 2. Physical Science | 10803 | 7426 | 68.74 | 14803 | 9924 | 67.04 |
| 3. Commerce | 10497 | 8396 | 79.98 | 13430 | 10022 | 74.62 |
| 4. Arts | 18720 | 15326 | 81.87 | 31726 | 23615 | 74.43 |
| 5. Engineering Technology | 2664 | 1868 | 70.12 | 3749 | 2522 | 67.27 |
| 6. Bio Systems Technology | 2221 | 1622 | 73.03 | 2988 | 2136 | 71.49 |
| 7. Other | 981 | 438 | 44.65 | 2324 | 1113 | 47.89 |
| **Total** | **61769** | **46552** | **75.36** | **94619** | **67489** | **71.33** |

Source: Dept. of Examinations, 2019